# කලාත්මක හා සෞන්දර්යාත්මක අංග රාශියකින් හෙබි හත්ථිකුච්ඡි විහාරය

එස්.එම්.අයි.එන්. සේනානායක[1], බී.එම්.එස්.ඊ. කරුණාරත්න[2]

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වන්නි හත් පත්තුවේ මී ඔයෙන් එගොඩ කෝරලේ ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් තඹුත්තේගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පිහිටා තිබෙන පැරණි බෞද්ධ සිද්ධස්ථානයක් ලෙස රාජාංගන විහාරය පෙන්වාදිය හැකිය. සිරි සංඝබෝධි නිරිඳු නාමයෙන් ඉදි කරන ලද හත්ථිකුච්ඡි විහාරය පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් ස්ථානයකි. සෙල්ලිපි මූලාශ්‍රයවල සඳහන් වන ආකාරයට ඇත්කුස යන්නෙන් අර්ථවත් වන හත්ථිකුච්ඡි යන නම ලැබී ඇති බව විද්වත් මතය වේ. මෙම විහාරයේ දැනට ශේෂව පවතින කලාත්මක හා සෞන්දර්යාත්මක අංග පිළිබඳ අධ්‍යනයේදී එහි ඇති නිශ්චල හා චංචල මානවකෘතිවලින් කලාත්මක හා සෞන්දර්යාත්මක අගයන් සන්නිවේදනය කර තිබේ ද යන්න මෙම අධ්‍යයනයේ දී විමසුමට බඳුන් වෙයි. මේ සඳහා ක්‍රමවේදය ලෙස සාහිත්‍ය හා පුරාවිද්‍යා මූලාශ්‍රය හා සම්මුඛ සාකච්ඡා උපයෝගී කර ගන්නා ලදී. හත්ථිකුච්ඡි විහාරස්ථානයට අයත් පැරණි සාධක දළ වශයෙන් අක්කර සියයක පමණ භූමි ප්‍රදේශයක විසිරී පවතී. ඒ අතර මෙම විහාරස්ථානයේ කැටයම්, මූර්ති, සිතුවම් යන අංශ තුනට අයත් නිර්මාණ දැකගත හැකිය. හත්ථිකුච්ඡි විහාරයේ ප්‍රතිමා ගත්විට ඒවා ඉතා දුර්ලභ ප්‍රතිමා වේ දැඩි ලෙස ස්වාභාවික හායනකාරක මෙන්ම මනුෂ්‍ය හායන ක්‍රියාකාරකම් නිසා හිටි, හිඳි, ඔත් යන තුන් වර්ගයටම අයත් බුද්ධ ප්‍රතිමා මෙම විහාරයේ පවතින නමුත් ඒවා විනාශයට පත්වී තිබේ. කැටයම්, මූර්ති අතර කොරවක්ගල, සඳකඩ පහණ, මුරගල් යනාදි අලංකරණ අංග ද ද මෙම ස්ථානය තුළ දක්නට ලැබේ. හත්ථිකුච්ඡි විහාරයේ පවතින වටිනා පුරාවස්තු දැනට හත්ථිකුච්ඡි කෞතුකාගාරයේ තැන්පත් කර ඇත. ඒ අතර තඹ තැටි, ලෝහ භාණ්ඩ, පහන්, ලෝහ උළු ආදිය දැකගත හැකිය. මේ නිර්මාණ තුළින් ඒවායේ ඇති කලාත්මක හා නිර්මාණාත්මක අගයන් ඔප්නැංවේ. ශෛලමය කැටයම් නිර්මාණ තුළින් ද හත්ථිකුච්ඡි විහාරයේ කලාත්මක හා නිර්මාණාත්මක බව ඔප්නැංවී තිබේ. එම නිර්මාණවලින් ඒ බව පැහැදිලි වී තිබේ. අතීත වටිනාකම් රැසක් ඇති හත්ථිකුච්ඡි විහාරස්ථානය පුරාවිද්‍යා වටිනාකමකින් යුක්ත ස්ථානයක් වන නිසා වර්තමානය වනවිට දෙස් විදෙස් සංචාරකයන්ගේ ද ආකර්ෂණයට පත්ව ඇති බැවින් ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් වන්නා වූ මෙම විහාරය තුළ පවතින කලාත්මක හා සෞන්දර්යාත්මක බව රැකගෙන මතු පරම්පරාව සඳහා ආරක්ෂා කර දීමට මෙරට උරුම කළමනාකරණ ආයතන කටයුතු කළ යුතු බව ද මෙම අධ්‍යයනය අනුව පෙන්වාදිය හැකිය.

ප්‍රමුඛ පද : හත්ථිකුච්ඡි, ඇත් කුස, කලාත්මක, බුදු පිළිම, මූලාශ්‍රය

[1 2] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය nishasenanayaka96@gmail.com